# සිංහල සාහිත්‍යයේ ප්‍රගමනයට අභයගිරි සම්ප්‍රදායේ දායකත්වය

පිටතලාවේ විමලසාර හිමි[1], අපරැක්කේ සිරිසුධම්ම හිමි[2]

## හැඳින්වීම

සිංහල සාහිත්‍යයේ සමාරම්භය සිදුවූයේ මහාවිහාරය සම්ප්‍රදායෙනි. ථෙරවාදය පදනම් කරගත් මෙම ආයතනයේ ලෞකික විෂයන් පිළිබඳ අවධානය යොමු නොවුණි. එහෙත් අභයගිරිය, මහායානය මූලික කරගත් ආයතනයක් හෙයින් බුදුදහමට අමතරව යන්ත්‍ර, මන්ත්‍ර, ජ්‍යෝතිෂ්‍යය, වෛද්‍ය, කාව්‍ය, නාටක, ඡන්දස් හා අලංකාර වැනි ක්ෂේත්‍ර පිළිබඳ මෙන්ම සංස්කෘත, පාලි, දෙමළ වැනි විවිධ විෂයන්ද අධ්‍යයනය කෙරිණි. එබැවින් මහාවිහාරයට වඩා අභයගිරිය පාදක කරගනිමින් ක්‍රියාත්මක වූ ශාස්ත්‍රීය ව්‍යාපාරය විවිධ ක්ෂේත්‍ර ඔස්සේ විසිරුණි. මෙම පර්යේෂණයේදී අවධානය යොමු වන්නේ අභයගිරිය පාදක කරගනිමින් ක්‍රියාත්මක වූ ශාස්ත්‍රීය ව්‍යාපාරය සිංහල සාහිත්‍යයේ ප්‍රගමනයට දායක වූයේ කෙසේද යන්න පිළිබඳවය. මෙය පුළුල් පරාසයක් කරා විහිද යන මාතෘකාවක් හෙයින් අනුරාධපුර, පොළොන්නරුව හා දඹදෙණිය යන යුග තුන පමණක් අධ්‍යයනයට පාදක කර ගැනේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය මූලික වශයෙන් සාහිත්‍ය මූලාශ්‍රයන් මත පදනම්ව සිදුවේ. එහිදී ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් මහාවංසය, නිකාය සංග්‍රහය, ධම්පියා අටුවා ගැටපදය, ධර්මප්‍රදීපිකාව, බුත්සරණ, පූජාවලිය වැනි කෘතිද ද්විතීයක මූලාශ්‍රය වශයෙන් මාතෘකාව හා සම්බන්ධ ශාස්ත්‍රීය කෘති, ලිපි ලේඛනද පාදක කරගනිමින් දත්ත එක්රැස් කිරීම සිදුවේ. එලෙස එක් රැස් කරගත් දත්ත ගුණාත්මක ක්‍රමවේදය යටතේ විශ්ලේෂණය කෙරේ.

## සාකච්ඡාව සහ ප්‍රතිඵල

වළගම්බා රජු දවස ආරම්භ වන අභයගිරිය මූලික කරගෙන නිදහස්, ලිබරල් සාහිත්‍යයක් සේවයක් ක්‍රියාත්මක විය. එය සංස්කෘත, පාලි සහ සිංහල යන අංශත්‍රය ඔස්සේම සිදුවිය. සංස්කෘත සාහිත්‍යයේ නියාමකයන් වූයේ ආර්යදේව (චතුඃශතකය, චිත්තවිශුද්ධිප්‍රකරණ), භදන්ත ධීරනාග පාද (කුන්දමාලා, සුභාෂිතාවලී උද්ධෘත), ආර්ය ශූරපාද (ජාතක මාලාව), බුද්ධදාස රජු (සාරාර්ථ සංග්‍රහය), ශ්‍රමණ දූත නම් සංස්කෘත සංදේශ කර්තෘ ආදීන්ය. (විජයසූරිය, 1992: 16-17) විවිධ

---

[1] පශ්චාත් උපාධි අපේක්ෂක, wimsarap@gmail.com

[2] කථිකාචාර්ය, රුහුණ විශ්වවිද්‍යාලය, sudhaaparekke@gmail.com

රජවරුන් කළ ග්‍රන්ථ සංහාර හේතුවෙන් පාලි සාහිත්‍යය පිළිබඳ විද්‍යමාන වන්නේ සද්ධම්මෝපායනය පමණි. මෙය කවි චක්‍රවර්ති ආනන්ද හිමියන්ගේ කෘතියකි. මීට අමතරව පාලි ජාතකට්ඨකථාව, ධම්මපදය සහ සහස්සවත්ථුව යන කෘතිද අභයගිරිවාසීන්ගේ නිර්මාණ බවට මත පළවී තිබේ. (අභයගිරි සංස්කෘතිය, 1977: 164)

සිංහල සාහිත්‍ය සම්ප්‍රදාය පිළිබඳ සැලකීමේදී අනුරාධපුර යුගයට අයත් පැරණි කෘති වශයෙන් සැලකෙන උත්තරවිහාරට්ඨකථා, විමුත්තිමග්ගය, කේශධාතුවංශය, දළදාවංශය, සියබස්ලකර, ධම්පියා අටුවා ගැටපදය, කලමිත් හිමිගේ ඡන්දස් කෘතිය අභයගිරි පාර්ශ්වයට අයත් ලේඛකයන්ගේ නිර්මාණ ලෙස සැලකේ. උත්තර විහාරය නමින් හැඳින්වූයේ අභයගිරියයි. එබැවින් උත්තරවිහාරට්ඨකථාව අභයගිරියට අයත් කෘතියක් ලෙස සැලකේ. විමුත්තිමාර්ගය අභයගිරිවාසී උපතිස්ස හිමියන්ගේ කෘතියකි. බුද්ධඝෝෂ හිමියන්ට විසුද්ධිමාර්ය රචනා කිරීම සඳහා මෙම කෘතියද ආශ්‍රය වී තිබේ. පුදපූජා, පිරිත් කීම, පෙරහැර පැවැත්වීම වැනි විචිත්‍රවත් පුදපූජා චාරිත්‍ර ක්‍රියාත්මක වූයේ අභයගිරි සම්ප්‍රදාය ආශ්‍රයෙනි. දන්ත ධාතූන් වහන්සේ ලක්දිවට වැඩම කරවූ දා සිට පෙරහැර චාරිත්‍රය සිදුවූයේ අභයගිරිකයන් අතිනි. (ඌනපූරණසහිතො මහාවංසො, 37. 96-97) එසේම වාර්ෂිකව දළදා වහන්සේ ප්‍රදර්ශනය කිරීමේ චාරිත්‍රයක්ද ක්‍රියාත්මක විය. මීට අමතරව බුදුරජාණන් වහන්සේගේ විචිත්‍රවත් පිළිම තැන්පත් කොට තැනූ විහාර මන්දිරද, ධාතු මන්දිරද අභයගිරියේ ඉදිවී තිබුණි. (බෞද්ධ රාජධානි පිළිබඳ තොරතුරු නම් වූ ෆාහියන්ගේ දේශාටන වාර්තාව, 1999: 95) මෙවැනි තොරතුරු සනාථ කරන්නේ උත්කර්ෂවත් ලෙස චාරිත්‍ර වාරිත්‍ර කිරීමේ සම්ප්‍රදාය අභයගිරිකයන්ගෙන් සමාරම්භ වූ බවයි. එබැවින් දළදා වහන්සේ සහ කේශධාතූන් වහන්සේගේ ගුණෝත්කර්ෂය ප්‍රමුඛ කරගත් කේශධාතුවංශය සහ දළදාවංශය අභයගිරිකයන්ගේ නිර්මාණ ලෙස සැලකීම පදනම් විරහිත කරුණක් නොවේ. නමස්කාර වර්ණනා නමින් සඳහන් වන කෘතියේ මූලික අරමුණ වන්නේ බුදුරජාණන් වහන්සේගේ නවඅරහාදී බුදුගුණ වර්ණනා කිරීමයි. කතුවරයා බුදුගුණ වැණීමෙන් උත්සාහ කරන්නේ පාඨකයා තුළ භක්තිය ජනනය කිරීමයි. භක්ති කාව්‍යකරණය මහායානයේ පවතින ප්‍රකට ලක්ෂණයකි. බුදුරදුන්ගේ නවඅරහාදී බුදුගුණ සිහිපත් කරමින් ඉදිකළ අභයගිරියට අයත් සෑයක් පිළිබඳ 4වන මිහිඳු රජුගේ මිහින්තලා සෙල්ලිපියේ කරුණු දැක්වේ. නමස්කාර වර්ණනාවෙන්ද කෙරෙන්නේ නවඅරහාදී බුදුගුණ වර්ණනාවක් බැවින් එය අභයගිරියට අයත් කෘතියක් ලෙස සැලකිය හැකිය. කෝසලබිම්බ වර්ණනාව හා දශබෝධි සත්වෝත්පත්ති කථා නමින් අභයගිරියට අයත් තවත් කෘති දෙකක් පිළිබඳ ඇතැම් වියත්හු කරුණු දක්වති. කෝසලබිම්භ වර්ණනාව බුදුපිළිම ඉදි කිරීමේ අනුහස් ඉදිරිපත් කිරීමට රචනා වූවකි. මහායානයේ පිළිම වන්දනාව ජනප්‍රිය චාරිත්‍රයක් වූ හෙයින් මෙම කෘතිය අභයගිරියට අයත් වන්නට ඇත. කාව්‍යාදර්ශය ආශ්‍රයෙන්

රචනා වන සියබස්ලකර අභයගිරි සම්ප්‍රදායට අයත් කෘතියකි. ඡන්දස්, අලංකාර පිළිබඳ අධ්‍යයන මෙන්ම සංස්කෘත පොතපත පරිශීලනය වූයේ අභයගිරි සම්ප්‍රදායෙනි. රත්නශ්‍රීඥාන කාව්‍යාදර්ශයට සංස්කෘතයෙන් ටීකාවක් රචනා කරන්නේද සියබස්ලකර රචනා වන වකවානුවේදීය. මෙයින් ප්‍රකට වන්නේ අභයගිරිකයන් සංස්කෘත අලංකාර ශාස්ත්‍ර පිළිබඳ විශේෂ නැඹුරුවක් දැක්වූ බවයි. සියබස්ලකර කර්තෘ පළමු සේන රජු සැලකෙන්නේ අභයගිරියට හිතවත්ව සිටි රජ කෙනෙකු වශයෙනි. එසේම සියබස්ලකරේදී කලාගුරු සුළුපාවැසි කලණමිත් හිමියන්ගේ ඡන්දස් කෘතියක් පිළිබඳ මහත් හරසරින් කරුණු දැක්වීමෙන්ද තහවුරු වන්නේ සියබස්ලකර අභයගිරි පරම්පරාවට අයත් කෘතියක් බවයි. ධම්පියා අටුවා ගැටපදයද අභයගිරි සම්ප්‍රදාය ගරු කළ කෘතියක් බැව් එහි මහායාන ඉගැන්වීම් ඇතුළත්ව තිබීමෙන් පැහැදිලිය. (සාසනරතන හිමි, 1999: 376) එසේම එහි කර්තෘ පස්වැනි කාශ්‍යප රජු අභයගිරියට පක්ෂව කටයුතු කළ රජ කෙනෙකි. ඡන්දස් අලංකාරාදි ලෞකික විෂයන් මහාවිහාර සම්ප්‍රදායේදී ප්‍රතික්ෂේපිත විය. මෙය තහවුරු වන අවස්ථාවක් ලෙස බුද්ධඝෝෂ හිමියන් මජ්ඣිම නිකා අටුවාවේදී සම්ඵප්පලාප යන පදය විස්තර කිරීමේදී භාරත යුද්ධ, සීතාහරණ ආදිය නිරර්ථක කථා වශයෙන් සැලකීම දැක්විය හැකිය. මෙනිසා අග්බෝ රජු දවස සිටි දොළොස් මහා කවීන්ද අභයගිරි සම්ප්‍රදාය ගරු කරන්නට ඇතැයි නිගමනය කළ හැකිය. ඒ අනුව මොවුන්ගේ නිර්මාණ වශයෙන් සැලකෙන අසක්දා කව හා සිදතේ සඳහන් වන මියුරු සඳෙස අභයගිරි සම්ප්‍රදාය ඔස්සේ නිර්මාණය වූ කෘති ලෙස සැලකිය හැකිය. මීට අමතරව සීගිරි පද්‍ය අතරද අභයගිරි කවීන් අතින් නිර්මාණය වූ ගී දක්නට ලැබේ. (සීගිරි පද්‍යාවලිය, 2004: 283, 335, 457 ගී)

අනුරාධපුර යුගයේදී ආරම්භ වන අභයගිරි සම්ප්‍රදායේ බලපෑම දැඩිව දක්නට ලැබෙන්නේ පොළොන්නරු යුගයේදීය. විශේෂයෙන් හින්දු සමය ඔස්සේ මතු වූ භක්තිවාදයට ප්‍රතිචාරයක් ලෙස බෞද්ධ භක්ති කාව්‍ය සාහිත්‍යය නිර්මාණ වූයේ මහායානය ප්‍රමුඛ කරගත් අභයගිරි සම්ප්‍රදායෙනි. ඒ අනුව ධර්මප්‍රදීපිකාව, අමාවතුර, බුත්සරණ, දහම්සරණ, සඟසරණ වැනි කෘතිවලින් බුදුරජාණන් වහන්සේ ආශ්චර්ය පුද්ගලයකු ලෙස නිරූපණය කර තිබේ. තේමාත්මක වශයෙන් පමණක් නොව සාහිත්‍ය කෘතිවල අන්තර්ගතය සැකසීමේදීද මහායාන මූලාශ්‍රයන් මෙන්ම අදහස් හේතු වී තිබේ. ශාන්තිදේවගේ බෝධිචර්යාවතාරය, ධර්මකීර්ති පාදයන්ගේ ප්‍රමාණවාර්තිකය, ආර්යශූරපාදගේ ජාතක මාලාව, පාදපංකජස්තවය වැනි මහායානික කෘතිවල පෝෂණය ධර්මප්‍රදීපිකාවට ලැබී ඇති අතර බුත්සරණේදී ත්‍රිකාය සංකල්පය උත්කර්ෂයෙන් දක්වා තිබේ. අමාවතුරේදී බුදුරජාණන් වහන්සේ නිරූපණය කෙරෙන්නේ බ්‍රහ්ම, අසුර, දේව, මනුෂ්‍ය, අමනුෂ්‍ය, තිරිසන් ආදී සියලු සත්ත්ව කොට්ඨාසයන් අතර බලයෙන් අගතැන්පත් කෙනෙකු වශයෙනි. ගද්‍ය සාහිත්‍යයට මතු නොව පද්‍ය සාහිත්‍ය විෂයෙහිද මහායානයේ ආභාසය ලැබී තිබෙන බව සසදාවත, මුවදෙව්දාවත වැනි නිර්මාණ විමසීමේදී පැහැදිලිය.

(සසදාවත, 234-236 ගී, මුවදෙව්දාවත, 155, 160-161 ගී) මෙම පද්‍ය නිර්මාණවලදී බෝධිසත්ත්ව සංකල්පය මෙන්ම මහායාන දහමේ දැක්වෙන ගැඹුරු සංකේත ඉදිරිපත් වී තිබේ. මීට අමතරව මහායාන ජාතකමාලාවේ එන ව්‍යාඝ්‍ර ජාතකය, හස්ති ජාතකය ආදියේ කරුණු මෙම ගී කාව්‍ය රචනයෙහිලා පාදක වී තිබේ. මහායාන බෝධිසත්ත්ව සංකල්පය ප්‍රබලව ඉස්මතු කෙරෙන කෘතියක් ලෙස දඹදෙණි යුගයේදී රචනා වන පූජාවලියට හඳුනාගත හැකිය. ගම්පොළ, කෝට්ටේ යුගවලදී පවා මෙම සංකල්පය ජනප්‍රිය වූ බව එළුඅත්තනගලු වංශය සාක්ෂ්‍ය සපයයි.

## සමාලෝචනය

අනුරාධපුර යුගයේ පටන් සාහිත්‍යකරණය සම්බන්ධයෙන් ආධිපත්‍යය පැවතියේ අභයගිරි සම්ප්‍රදාය සතුවය. සියබස්ලකරින් සමස්ත සිංහල සාහිත්‍යය සම්ප්‍රදායට න්‍යායන් පනවන්නේ එහි ආධිපත්‍යයේ තරම පෙන්වමිනි. එසේම එම න්‍යායයන් බණ්ඩනයට කිසිවෙකු නොපෙළඹුණේ සාහිත්‍යකරණයේ නියැළුණු බොහෝ පිරිස අභයගිරි සම්ප්‍රදාය අනුගමනය කිරීම සහ රාජ්‍ය බලයද ඔවුන් වෙත නතු වීම හේතුවෙනි. මෙයින් ප්‍රකට වන්නේ අනුරාධපුර යුගයේ පටන් ක්‍රමයෙන් ගොඩනැගුණු සිංහල සාහිත්‍ය සම්ප්‍රදායේ මූලික සංකල්ප බහුතරයක් අභයගිරි සම්ප්‍රදාය ඇසුරෙන් නිර්මාණය වූ බවයි.

ප්‍රමුඛ පද : අභයගිරි සාහිත්‍යය, මහායානය, සිංහල සාහිත්‍යය

## ආශ්‍රිත ග්‍රන්ථ

*ඌනපූරණසහිතො මහාවංසො.* (1959). (සංස්.) පොල්වත්තේ බුද්ධදත්ත හිමි. කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

ධම්මික හිමි, වැල්ලම්පිටියේ. (1977). (සංස්.) *අභයගිරි සංස්කෘතිය.* කොළඹ: ප්‍රදීපක ප්‍රකාශකයෝ.

පරණවිතාන, සෙනරත්. (2004). *සීගිරි ගැහිටි,* (පරි.) නන්දසේන මුදියන්සේ, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

*බෞද්ධ රාජධානි පිළිබඳ තොරතුරු නම් වූ ෆාහියන්ගේ දේශාටන වාර්තාව.* (1999). (පරි.) විමල් ජී. බලගල්ලේ, බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශන.

සාසනරතන හිමි, මොරටුවේ. (1999). ලක්දිව මහායාන අදහස්. බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ.